**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**Department of Education, Southern Province**

**දෙවන වාර පරීක්ෂණය - 2023**

**Second Term Test- 2023**

| | | |
|---|---|---|
| 7 **ශ්‍රේණිය**<br>**Grade 7** | **සිංහල භාෂාව හා සාහිත්‍යය** | **පැය දෙකයි**<br>**Two hours** |

නම :- ..........................................................................................................................

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- 1 කොටසේ ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයා, 11 පත්‍රයේ පිළිතුරු පත්‍රය සමග අමුණා භාරදෙන්න.

## 1 කොටස

- පහත ඉරි ඇඳි පදයට ගැළපෙන සාම්ප්‍රදායික යෙදුම තෝරන්න.

**1.** නිමල් සෑම දිනක ම **<u>කුකුළා අතින් අරන්</u>** පාසලට පැමිණෙන්නේ ය.
1. සන්තෝෂයෙන් 2. කුකුළා අතින් රැගෙන 3. උදෑසනින් ම 4. ප්‍රමාද වී

**2.** **<u>'විමසීමකින් තොර ව වැඩ කිරීම'</u>** යන අදහසට වඩාත් ම ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.
1. ගහට ඉනි කැපුවා වගේ 2. අබරා සිල් ගත්තා වගේ
3. කළුවා මාරපන් ගියා වගේ 4. මඩේ සිටවූ ඉන්න වගේ

**3.** පුරෝගාමියා, බඩසයින්, උරණ ව යන පදවල නිවැරදි අර්ථ විග්‍රහය වනුයේ,
1. ප්‍රමුඛයා ,බඩ පිරුණු, සතුටු ව 2. ප්‍රධානියා, බඩ රිදීමෙන්, කම්මැළි ව
3. මුල්වූ තැනැත්තා, බඩපිරී , කෝප වී 4. මුල් වූ තැනැත්තා, කුසගිනි, කෝප වී

**4.** **"වත සුපිපි පියුමෙකි - නෙත සුනිල් මිණි යුවළෙකි"**

යන පද්‍ය ඛණ්ඩයේ ඇති මූර්ධජ අකුරු ගණන කීය ද?

1. එකකි 2. දෙකකි 3. තුනකි 4. හතරකි

**5.** වර්......නය, ලේඛ......, පිළිවෙ......, කණ්......ඩි යන වචනවල හිස්තැනට යෙදිය යුතු නිවැරදි අක්ෂරය සහිත වරණය තෝරන්න.
1. ධ, න, ළ,ණා 2. ද, න, ල, නා 3. ධ,ණ, ළ, නා 4. ද, ණ, ල, ණා

**6.** සිදත් සඟරා හෝඩියේ ඇතුළත් ස්වර ගණන කීය ද?
1. 18 2. 16 3. 10 4. 12

- **හිස්තැනට ගැළපෙන වචනය තෝරන්න.**

**7.** සඳ ...... (කිරන / කිරණ ) දැක කුමුදු විකසිත වෙයි.

**8.** සප්පායම, ගොම්පස්, උප්පිඩ යන කමත් වහර හා බැඳුණු පොදු වහර නම් කරන්න.
1. හීල් අඩුක්කුව, ගොම, ගොයම් මිටිය 2. සේදැරිය, ගොන් කණුව, මාප්පිඩ
3. කෑම ගැනීම, වියළි ගොම, ගොයම 4. ආහාර අනුභවය, ගොම, අතට හසුවන ගොයම් ප්‍රමාණයක මිටිය

**9.** පහත දැක්වෙන පද සඳහා ස්ත්‍රීලිංග පද නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
**<u>ඇතා</u>** පිට නැඟි **<u>පුරුෂයා</u>** **<u>රජ</u>** කරා පැමිණියේ ය.
1. කෙණෙර, ගැහැනිය, රැජින 2. ඇතින්න, ගැහැනිය, බිසව
3. හස්තියා, ගැහැනිය, බිසව 4. වරණිඳු, සත්පුරුෂයා, රජතුමා

**10.** උක්ත නාම පද පමණක් අන්තර්ගත වරණය කුමක් ද?
1. මනාලියක්, සහෝදරියක, මිනිසකු
2. මම, ගුරුවරියක්, මිනිස්සු
3. මිනිසෙක් , අප, කුරුල්ලකු
4. මිනිසුන්, මනාලියක, සහෝදරියක්

**11.** ඉරි ඇඳි ක්‍රියා පද වර්ග නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
ඔහු උදැසන **<u>නැගිට</u>** දත් **<u>මැද මැද</u>** එළියට ආවේ ය.
1. අවසාන ක්‍රියා, අනවසාන ක්‍රියා
2. මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා
3. අනවසාන ක්‍රියා, පූර්ව ක්‍රියා
4. පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා

**12.** ඉරි ඇඳි පදවල විරුද්ධාර්ථ පද නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
**<u>ඉහළ</u>** අහසේ **<u>ඈත</u>** පාවෙන සරුංගලය දෙස මල්ලි **<u>සතුටින්</u>** බලා සිටියේ ය.
1. අහස, එහා, තුට
2. පහළ, මෑත, අසතුටින්
3. පහළ, මෙහා, තුටින්
4. උඩ, මෑත, අසතුට

**13.** " **කලා වැවේ නිල් දියවර අපෙ අම්මා**" යන ගීත ඛණ්ඩයේ දැක්වෙන කාව්‍යාලංකාරය කුමක් ද?
1. උපමා
2. විරිත
3. අනුප්‍රාසය
4. රූපක

**14.** පැහැ සරණිය මිණි පැමිණිය කොත් අගට
බඳ කිකිණිය දද ගිහිණිය විමන් වට
නොව පැරණිය වන රමණිය විටින් විට
සැළලිහිණිය වදු කැලණිය පුර වරට
ශබ්ද එකිනෙකට නින්නාද වන අයුරින් මේ කාව්‍යයෙහි යොදා ඇති කාව්‍යාලංකාරය කුමක් ද?
1. විරිත
2. ලය
3. අනුප්‍රාසය
4. උපමා

**15.** ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යයක අන්තර්ගත වරණය තෝරන්න.
1. පුරාවිද්‍යාඥයෝ කරුණු අනාවරණය කරති.
2. දෙදෙනකු මයිනහම අදිති.
3. ගිරවකු අඹ කයි
4. අපි මිහිරි නාදයක් අසමි.

**16.** හිස්තැනට ගැළපෙන කවි පදය වන්නේ.
මේ කාගේ මේ කමතා
සැම දෙවියන්ගේ කමතා
සැම දෙවියෝ බිම බදිතා
.............................................................
1. සඳ දෙවියෝ වැඩි කමතා
2. බිම් බැදි තැන කොළ බදිතා
3. ගෙන පුරවා මේ කමතා
4. අටු කොටුවල තියෙන බැතා

**17.** පුරාණ කාලයට අයත්, බොහෝ පැරණි කතා පුවත්, අනුන් ගැන සිතා කටයුතු කරන යන පද සඳහා තනි පද පිළිවෙළින් දැක්වෙන වරණය වන්නේ,
1. පෞරාණික, පුරාවෘත්ත, පරාර්ථකාමී
2. වර්තමාන, අට්ඨකථා, පරගැති
3. පුරාණ, පෞරාණික, පරසිත්
4. පෞරාණික, පුරාතන, පරගැති

**18.** **<u>නෙලුම්</u>** කොළ මත දිය බිඳු **<u>සතුටින්</u>** සෙල්ලම් කරන අයුරු සිනා කුමරි පැදි පෙළෙහි කවියා **<u>රසවත් ව</u>** වර්ණනා කර ඇත. මෙහි ඉරි ඇඳි පද අයත් වන්නේ,
1. නාම විශේෂණ, නාම විශේෂණ, ක්‍රියා විශේෂණ
2. ක්‍රියා විශේෂණ, නාම විශේෂණ, නාම විශේෂණ
3. නාම විශේෂණ, ක්‍රියා විශේෂණ, ක්‍රියා විශේෂණ
4. නාම විශේෂණ ,ක්‍රියා විශේෂණ, නාම විශේෂණ

**19.** පන්සිය පනස් ජාතක පොත ලියවුණු යුගය කුමක් ද?
1. කෝට්ටේ
2. ගම්පොළ
3. දඹදෙණිය
4. කුරුණෑගල

**20.** ලීලානන්ද ගමාච්චි, මඩවල එස්. රත්නායක, ටී. බී ඉලංගරත්න යන කතුවරුන් ලියූ කෘති පිළිවෙළින් ඇතුළත් වරණය වන්නේ,
1. අඹ යාලුවෝ, හරි පුදුම ස්කෝලේ, අක්කර පහ
2. හරි පුදුම ස්කෝලේ, අක්කර පහ, අඹ යාලුවෝ
3. අක්කර පහ, අඹ යාලුවෝ, හරි පුදුම ස්කෝලේ
4. අක්කර පහ, හරි පුදුම ඉස්කෝලේ, අඹ යාලුවෝ

( ලකුණු 2 x 20 = 40යි)

PAST PAPERS WIKI

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

## 11 කොටස

**සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1. ඔබ ප්‍රදේශයේ පැතිර යන ඩෙංගු වසංගතය හේතුවෙන් නිවෙස් පරීක්ෂාව සඳහා ජනතාව දැනුවත් කිරීමට,
   i. සෞඛ්‍ය කාර්යාලය විසින් කරනු ලබන නිවේදනයක් ලියා දක්වන්න. (ලකුණු 04යි)
   ii. නිවේදනයක් යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද? (ලකුණු 02යි)
   iii. නිවේදනයක දී සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් ලියන්න. (ලකුණු 02යි)
   iv. ඔබට එදිනෙදා ජීවිතයේ නිවේදන අසන්නට ලැබෙන ස්ථානයක් ලියන්න. (ලකුණු 01යි)
   v. නිවේදනයකින් අපට ලැබෙන ප්‍රයෝජනයක් ලියන්න. (ලකුණු 01යි)

2. පහත දී ඇති මාතෘකා අතරින් එකක් තෝරා ගෙන වචන 150ට නොඅඩු වන සේ රචනාවක් ලියන්න.
   i. වැඩිහිටියන්ට සලකමු
   ii. සිරිලක් මව සුරකිමු
   iii. දහම් අධ්‍යාපනයේ අගය
   iv. කෘෂි ආර්ථිකය හා බැඳුණු චාරිත්‍රවල අගය
   v. අපේ අතීත කලා ශිල්ප

( ලකුණු 20යි)

3. ඔබ පාසලේ ශිෂ්‍ය නායක නිල ලාංඡන පැළඳවීමේ උත්සවය 2023.10.20 දින පෙ.ව.9.00ට විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේ දී පැවැත්වීමට සංවිධායක කමිටුව තීරණය කර ඇත. මෙහි ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආදි ශිෂ්‍ය බ්‍රිගේඩියර් සඳුන් අබේසේකර මැතිතුමා සහභාගි වේ. මෙම තොරතුරු ඇසුරු කර ගනිමින් පාසල් ප්‍රජාව වෙත යැවීමට සුදුසු ආරාධනා පත්‍රයක් සකස් කරන්න.

( ලකුණු 10යි)

4. පහත සඳහන් ප්‍රකාශ කවුරුන් විසින් කාහට කියන ලද්දේ ද?
   i. "මං හිතුවෙ ඔයා ඔත්තු කාරියක් වෙන්න යනවා කියලා"
   ii. "යම් කෙනෙක් මරා දමා පූ නම් මේ රාජ ශ්‍රී ලබන්නට නැත්තේ වේ ද? "
   iii. "ඒක ලීවලින් හදපු එකක් නේද?"
   iv. "අපි නැහුණා ! අපි නැහුණා. දුවමු, දුවමු"
   v. "පුතා, උඹ යන්ට කැමති ද නුවර ? " (ලකුණු 10යි)

5. **අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු කෙටියෙන් සපයන්න.**

ශ්‍රී ලංකාවේ පහතරට වියළි කලාපයේ ගංගා ඉවුරුවල බහුලව වැවෙන නික සාමාන්‍යයෙන් ලංකාව පුරා ම වැවෙන ශාකයක් ලෙස හඳුනාගෙන ඇත. නික ගසේ කොළ, දළු, පොතු, මුල්, ගෙඩි ඖෂධ වශයෙන් ගැනේ. වේදනාව සමනය කිරීමේ හැකියාවක් ද, ඉදිමුම අඩු කිරීමට ද සමත් ඖෂධයකි. සන්ධි හා මාංශ පේශීන්ගේ වේදනාව සමනය කිරීමට ද යොදා ගන්නා නික කොළ තම්බාගත් වතුර, ශරීරය මතුපිට සැදෙන චර්ම රෝග මර්දනයට ද යෝග්‍ය ය. කනේ කැක්කුමට ද නික කොළ තැම්බූ වතුර උණුසුම් සහිත ව ගෙන කන් වටේ තැවීමෙන් එම වේදනාව සමනය කළ හැකි ය.

   i. මෙහි සඳහන් ඖෂධීය ශාකය කුමක් ද?
   ii. ඡේදයේ සඳහන් පරිදි මෙම ශාකයේ කවර අංග ඖෂධ වශයෙන් ගැනේ ද?
   iii. එම ඖෂධීය ශාකය බහුල ව වැවෙන ප්‍රදේශය කුමක් ද?
   iv. කනෙහි වේදනාවක් ඇති විට මෙම ඖෂධය භාවිත කරන්නේ කෙසේ ද?
   v. මෙම ඖෂධය තැම්බූ වතුර යොදා ගන්නේ කුමන රෝග සඳහා ද?

(ලකුණු 10යි)

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Department of Education, Southern Province

දෙවන වාර පරීක්ෂණය - 2023
Second Term Test- 2023

7 ශ්‍රේණිය
Grade 7

## සිංහල භාෂාව හා සාහිත්‍යය

පිළිතුරු

### 1 කොටස

| | | | |
|---|---|---|---|
| 1 – 3 | 6 – 3 | 11 – 4 | 16 – 2 |
| 2 – 3 | 7 - කිරණ | 12 – 2 | 17 – 1 |
| 3 – 4 | 8 – 4 | 13 – 4 | 18 – 3 |
| 4 – 2 | 9 – 2 | 14 – 3 | 19 – 4 |
| 5 – 1 | 10 – 2 | 15 – 1 | 20 – 2 |

( ලකුණු 2 x 20 = 40යි)

### 11 කොටස

**1)**

i. නිවේදනයට අදාළ ව කරුණු ගළපා තිබිය යුතු ය (ලකුණු 04යි)
ii. බොහෝ පිරිසකට සිදුකරන දැනුම් දීමක් (ලකුණු 02යි)
iii. නිවැරදි හඬ පාලනයෙන් යුතුව සිදු කිරීම / ශබ්ද නගා ඉදිරිපත් කිරීම (ලකුණු 02යි)
iv. පාසල, දුම්රිය ස්ථානය, ප්‍රදර්ශන භූමි (සුදුසු පිළිතුරු සඳහා ලකුණු ලබා පිරි නමන්න.) (ලකුණු 01යි)
v. අවශ්‍ය පරිදි සුදානම් විය හැකි වීම, එහි ඇතුළත් කරුණු කෙරෙහි සැලකිලිමත් වීම (සුදුසු පිළිතුරු සඳහා ලකුණු ලබා පිරි නමන්න.) (ලකුණු 01යි)

**2)** රචනාව සඳහා සුදුසු පරිදි ලකුණු පිරිනමන්න. ( ලකුණු 20යි)

**3)** අරමුණ, දිනය, වේලාව, ස්ථානය ප්‍රධාන ආරාධිත අමුත්තා ආරාධනා කරන්නේ කවුරුන්ද.........යනාදී ආරාධනා පත්‍රයෙහි අඩංගු විය යුතු කරුණු සලකා ලකුණු ලබා දෙන්න. ( ලකුණු 10යි)

**4)**

| | | |
|---|---|---|
| i. | මව | ටොට්ටෝ චං |
| ii. | දිසාපාමොක් ආචාරින් | බ්‍රහ්මදත්ත රජුගේ පුතාට |
| iii. | අනුරාධ | සිරිමල්හට |
| iv. | ගොවියා | ගොවි බිරිඳට |
| v. | පියා | නිමල් |


(ලකුණු 2x 5 =10යි)

**5)**

i. නික
ii. කොළ, දළු, පොතු, මුල්, ගෙඩි
iii. වියළි කලාපයේ (පහතරට)
iv. නික කොළ තැම්බූ වතුර උණුසුම් සහිත ව ගෙන කන වටේ තැවීමෙන්
v. සන්ධි හා මාංශපේශී වේදනාව සමනයට ශරීරය මතුපිට සැදෙන චර්ම රෝග සඳහා කන්කැක්කුමට ( කරුණු දෙකක් දක්වා තිබීම ප්‍රමාණවත්) ( ලකුණු2x5= 10යි)

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

# 7 ශ්‍රේණිය කෙටි සටහන් පොත් Short Notes





Rs : 300





Rs : 300




Rs : 300




Rs : 300





Rs : 300




Rs : 300





Rs : 300





Rs : 300

**7 ශ්‍රේණිය ඉංග්‍රීසි මාධ්‍ය කෙටි සටහන් පොත්**

**English Medium Short Notes**




Rs : 180




Rs : 180

මෙම කෙටි සටහන් පොත් සකස් කොට ඇත්තේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදනය කොට ඇති නව විෂය නිර්දේශය අනුව, විෂය ප්‍රවීණත්වයෙන් යුත් සම්පාදක මණ්ඩලයක් විසිනි, එහෙයින් මෙහි අන්තර්ගත සියලු සටහන් එම විෂය නිර්දේශයේ සෑම මාතෘකාවක්ම ආවරණයකොට තිබේ. මෙම ග්‍රන්ථ සම්පාදනය කිරීමේ දී පූර්ණ අවධානය යොමුකොට ඇත්තේ සිසුන්ට මෙන්ම ගුරුවරුන්ට ද අවශ්‍යයෙන්ම මතකයේ තබා ගත යුතු සියලු කරුණු අන්තර්ගත කරමින් වන හෙයින් වෙනත් අතිරේක ග්‍රන්ථ පරිහරණයකින් තොරව වුවද අදාල විෂය නිර්දේශයේ වැදගත් කරුණු සියල්ල ඉතා පහසුවෙන් හැදෑරීමේ මෙන්ම මතකයේ රඳවා ගැනීමේ හැකියාව ද ලැබෙනු ඇත.

LOL.LK
LOL STORE (PVT) LTD
CASH ON DELIVERY | VISA | mastercard | KOKO
037 20 60 110
071 77 74 440
Buy Now
CLICK HERE